# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 15 දරන
# ළමයින් දරුකමට හදා ගැනීමේ
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 75 යි.　　තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 15 දරන ළමයින් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 73/88.

**ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 15 දරන ළමයින් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (61 වන අධිකාරය වූ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 61 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5අ) (අ) ඉල්ලීම කරන ලද්දේ කවර ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා දරුකමට හදා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියකු වූ ද ශ්‍රී ලංකාවෙහි වාසය කරන්නා වූ ද, වසතිය ඇත්තා වූ ද වෙනත් යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කරනු ලැබ නොමැත්තේ නම්, ශ්‍රී ලංකා පුරවැසියකු නොවන්නා වූ ද ශ්‍රී ලංකාවේ වාසය නොකරන්නා වූ සහ වසතිය නොමැත්තා වූ ද යම් ඉල්ලුම්කරුවකුගේ නමට දරුකමට හදා ගැනීමේ ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(ආ) (i) යම් ලිත් වර්ෂයක් තුළ දී සියලුම අධිකරණ විසින්, ශ්‍රී ලංකා පුරවැසියන් නොවන සහ කවර අවස්ථාවක හෝ ශ්‍රී ලංකා පුරවැසියන් ලෙස නොසිටියා වූ ද ශ්‍රී ලංකාවෙහි වාසය නොකරන්නා වූ සහ වසතිය නොමැත්තා වූ ද ඉල්ලුම්කරුවන් නමින් කරනු ලැබිය හැකි දරුකමට හදා ගැනීමේ ආඥා සංඛ්‍යාව නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු ය.

(ii) දරුකමට හදා ගැනීමේ ආඥාවක් කිරීමේ ප්‍රතිඵලය වනුයේ, ඒ ආඥාව කරනු ලැබිය යුතු ලිත් වර්ෂය සඳහා (අ) ඡේදය යටතේ නියම කරනු ලැබ ඇති සංඛ්‍යාව ඉක්මවීම නම්, ශ්‍රී ලංකා පුරවැසියන් නොවන සහ කවර අවස්ථාවක හෝ ශ්‍රී ලංකා පුරවැසියන් ලෙස නොසිටියා වූ ද ශ්‍රී ලංකාවෙහි වාසය නොකරන්නා වූ සහ වසතිය නොමැත්තා වූ ද ඉල්ලුම්කරුවන් කිසිවකු නමින් දරුකමට හදා ගැනීමේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය." ; සහ

2—ඩී 013918,8210 (91/06)

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඇති අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද, ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නා වූ ද ශ්‍රී ලංකාවේ වාසය නොකරන්නා වූ ද, වසතිය නොමැත්තා වූ ද, ස්වාමි පුරුෂයකු හා භාර්යාවක විසින් හවුල් ඉල්ලීමක් කරන ලද විට, අවසර දීමට තිබෙන දරුකමට හදා ගැනීම පිළිබඳ සමාජයීය සහ මානසික තත්ත්වය ගැන සහ 4 වන වගන්තියේ සඳහන් කාරණා ගැනද වාර්තාවක් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගෙන් ලබාගෙන, එය සලකා බැලීමෙන් පසුව, ඒ හවුල් ඉල්ලීම ඉදිරිපත් කළ ඉල්ලුම් කරුවන්ට පක්ෂව දරුකමට හදා ගැනීමේ ආඥාවක් කිරීම යුක්ති සහගත බවට පත්කරන විශේෂ අවස්ථානුගත කරුණු තිබෙන බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක—

(අ) තත් කාලයේදී ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන අනාථ දරු නිවාසයක්, නිවාසයක් හෝ වෙනත් ආයතනයක් හෝ යටත් පිරිසෙසින් අවුරුදු පහක කාලසීමාවක් සඳහා අනාථ දරු ආඥා පනත යටතේ ලියාපදිංචි කර ඇති අනාථ දරු නිවාසයක් භාරව සිටින තැනැත්තකුගේ ආරක්ෂාව, භාරය හෝ පාලනය යටතේ සිටින ; සහ

(ආ) පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් තෝරන ලද

ළමයකු එම ස්වාමිපුරුෂයා සහ භාර්යාව විසින් දරුකමට හදාගැනීම සඳහා බලය පවරන දරුකමට හදා ගැනීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය. ඒ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා අධිකරණය විසින් නියම කරන ලද කාලසීමාව ඇතුළත කොමසාරිස්වරයා විසින් ඒ වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ කාලසීමාව, අධිකරණය ඒ වාර්තාව කැඳ වූ දිනයෙහි සිට දින දහ හතර කට නොඅඩු සහ දින විසි අටකට නොවැඩි හෝ විය යුතු ය.

තවද—

(අ) ඉල්ලුම්කරුවන්ගේ රට විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් වූ පරිසර අධ්‍යයන වාර්තාවක් ; සහ

(ආ) ඉල්ලුම්කරුවන් පදිංචිව සිටින්නේ යම් ප්‍රදේශයක් ඇතුළත ද, ඒ ප්‍රදේශයේ පොලිස් බලධරයාගෙන් ලබාගත් පොලිස් වාර්තාවක් ද

ඒ රටේ සිටින ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතිත නියෝජිතයා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබ එම වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියෙහි,—

"පරිසර අධ්‍යයන වාර්තාවක්" යන්නෙන් ඉල්ලුම්කරුවන්ගේ මානසික ස්වාස්ථ්‍යය, ඔවුන්ගේ සමාජයීය, ආගමික සහ ආර්ථික පසුබිම සහ ළමයකු දරුකමට හදා ගැනීමට ඔවුන්ගේ යෝග්‍යතාව පිළිබඳ වූ වාර්තාවක් අදහස් වේ ; තව ද

"පොලිස් වාර්තාව" යන්නෙන් ඉල්ලුම්කරුගේ කල් ක්‍රියාව සහ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් අදහස් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (ඈ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඈ) අධිකරණය විසින් අවසර දෙනු ලැබිය හැකි පරිදි හැර, දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් කිසිම ගෙවීමක් හෝ වෙනත් ත්‍යාගයක්—

(i) ඉල්ලුම්කරු විසින් යම් තැනැත්තකුගෙන් ලබා නොමැති බව හෝ ලබා ගැනීමට එකඟ වී නොමැති බව සහ යම් තැනැත්තකුට කර නොමැති බව හෝ ප්‍රදානය කර නොමැති බව හෝ කිරීමට හෝ ප්‍රදානය කිරීමට එකඟ වී නොමැති බව ; හෝ

(ii) කිසිම තැනැත්තකු ඉල්ලුම්කරුගෙන් ලබා නොමැති බව හෝ ලබා ගැනීමට එකඟ වී නොමැති බව සහ කිසිම තැනැත්තකු විසින් ඉල්ලුම්කරුට කර නොමැති බව හෝ ප්‍රදානය කර නොමැති බව හෝ කිරීමට හෝ ප්‍රදානය කිරීමට එකඟ වී නොමැති බව.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 අ වගන්තිය සංශෝධනය කිරීම.

"(1) ළමයකු දරුකමට හදා ගැනීම පිණිස ස්වාමිපුරුෂයා සහ භාර්යාව යන දෙදෙනාටම බලය පවරමින් අධිකරණය විසින් දරුකමට හදා ගැනීමේ ආඥාවක් (ඒ දරුකමට හදා ගැනීමේ ආඥාව මේ වගන්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව හෝ පසුව කරනු ලැබ ඇත්තේ වුව ද) කරනු ලැබ ඇති

අවස්ථාවක, ඒ ළමයාගේ උප්පැන්නය, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඊට කලින් ලියාපදිංචි කරනු ලැබ තිබුනේ වී නමුත්,—

(අ) ඒ ස්වාමිපුරුෂයා හා භාර්යාව විසින් ; හෝ

(ආ) දරුකමට හදාගැනීමේ ආඥාවේ දිනයෙන් පසු, ඒ ස්වාමිපුරුෂයාගේ හා භාර්යාවගේ විවාහය අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දෙදෙනාගෙන් එක් අයකු විසින් ; හෝ

(ඇ) ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම මියගොස් ඇති අවස්ථාවක—

(i) ඒ ළමයාගේ වයස අවුරුදු දහඅටට වැඩි නම් ඒ ළමයා විසින් ; හෝ

(ii) ඒ ළමයාගේ වයස අවුරුදු දහඅටට අඩුනම්, වයස අවුරුදු දහඅටට වැඩි වූ ඒ ළමයාගේ ආච්චි, සීයා, මාමා, නැන්දා හෝ සහෝදරයා හෝ සහෝදරිය විසින් හෝ මහාභාර කරු විසින් නැතහොත් පරිවාස හා ළමා ආරක්ෂකසේවා කොමසාරිස් වරයා විසින්

ඒ ස්වාමිපුරුෂයාගේ සහ භාර්යාවගේ නම් ඒ ළමයාගේ ස්වභාවික දෙමාපියන් ලෙස ඇතුළත් කරමින් ඒ ළමයාගේ උප්පැන්නය නැවත ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකෘතියෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලිඛිත ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම ප්‍රකාශයක් සඳහාම රුපියල් පහක වටිනාකම ඇති මුද්දරයක් අලවා තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශයක් ලැබීමෙන් පසු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, ඒ ප්‍රකාශය කරනු ලැබ ඇති ළමයා වෙනුවෙන් අධිකරණයක් විසින් දරුකමට හදා ගැනීමේ ආඥාවක් කරනු ලැබ ඇති බවට සහ ඒ ළමයා කෙරෙහි ප්‍රකාශ කරන්නාට ඇති නෑකම ගැන ඔහු සෑහීමට පත්වන්නේ නම්, නියම කරනු ලැබ ඇති ආකාරයට ඒ උප්පැන්නය නැවත ලියාපදිංචි කළ යුතු ය. ".

5. 10ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 10ඇ. වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 10 ඇ. අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි සෑම දරුකමට හදාගන්නකු විසින් ම වාර්තා සැපයිය යුතු බව.

10ඇ. 3 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඇති අතුරු වගන්තිය යටතේ ළමයකු දරුකමට හදා ගැනීම සඳහා දරුකමට හදා ගැනීමේ ආඥාවක් මගින් බලය පවරනු ලැබ ඇති අවස්ථාවක දී, එම දරුකමට හදා ගන්නා තැනැත්තාගේ රට විසින් පිළිගනු ලැබූ ආයතනයක් විසින් පිළියෙල කරනු ලැබ එම රටේ සිටින ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතීත නියෝජිතයා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ ප්‍රගති වාර්තා—

(අ) ඒ ළමයා දරුකමට හදා ගැනීම එම රටෙහි නීත්‍යානුකූලව ස්ථිර කරනු ලබන තුරු, ළමයා සම්බන්ධයෙන් තෙමසකට වරක් ද ;

(ආ) දරුකමට හදා ගැනීම එම රටෙහි නීත්‍යානුකූලව ස්ථිර කරනු ලැබූ දින සිට පළමු වර්ෂ තුන සඳහා ළමයාගේ ඡායාරූප ද සමඟ ළමයා සම්බන්ධයෙන් මාස හයකට වරක් ද ;

(ඇ) එම ළමයාගේ වයස අවුරුදු දහය වන තුරු එම ළමයා සම්බන්ධයෙන් වාර්ෂිකව ද

පරිවාස හා ළමා ආරක්ෂක සේවා කොමසාරිස් වරයා වෙත සැපයීම එවැනි සෑම දරුකමට හදා ගන්නකුගේ ම කාර්යය විය යුතු ය. ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ගෙවීම් සීමා කිරීම.

14. මේ කොටස යටතේ යම් ළමයකු දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් අධිකරණයේ අවසරය ඇතිව හැර, යම් තැනැත්තකුගෙන් යම් ගෙවීමක් හෝ ත්‍යාගයක් ලබාගන්නා හෝ යම් තැනැත්තකුට යම් ගෙවීමක් හෝ ත්‍යාගයක් කරන හෝ දෙන නැතහොත් යම් ත්‍යාගයක් හෝ ප්‍රදානයක් කිරීමට හෝ දීමට එකඟවන යම් දරුකමට හදා ගන්නකු ද අධිකරණයේ අවසරය ඇතිව හැර, යම් දරුකමට හදා ගන්නකුගෙන් එවැනි යම් ගෙවීමක් හෝ ත්‍යාගයක් ලබාගන්නා හෝ එවැනි යම් ගෙවීමක් හෝ ත්‍යාගයක් කරන හෝ දෙන නැතහොත්

යම් ත්‍යාගයක් හෝ ප්‍රදානයක් කිරීමට හෝ දීමට එකඟ වන යම් තැනැත්තකු ද මේ ආඥාපනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියට 27 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

7. 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

*" නීති විරෝධී ලෙස භාරයේ තබාගැනීමට එරෙහිව තහනම.*

27අ. (1) කිසිම තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින්—

(අ) යම් ළමයකු ලැබීමට සිටින යම් කාන්තාවක ඇගේ ගර්භනී කාලය තුළ දී ;

(ආ) යම් ළමයකු ඔහුගේ මව සමඟ හෝ මව නොමැතිව—

එම ළමයා දරුකමට හදා ගැනීමට ලබා දීමේ කාර්යය සඳහා, නීති විරෝධී ලෙස භාරයේ තබා ගෙන නොසිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.*

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ඉඉ) ආණ්ඩුවේ නොවන සංවිධානයක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද යම් ළමා නිවාසයක් තත් කාලයෙහි භාරව සිටින යම් තැනැත්තෙක් ; ".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.